**ශීර්ෂය 115- ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයේ අමාත්‍යාංශයේ ගිණුම් පිළිබද පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 31 දින අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 167.55 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 162.50 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 5.04 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 3.01 ක් විය. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 133.50 | 132.18 | 1.32 | 0.99 |
| මූලධන | 34.05 | 30.33 | 3.72 | 10.93 |
| **එකතුව** | **167.55** | **162.51** | **5.04** | **3.01** |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

අමාත්‍යාංශය විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 20.03.02.21 යටතේ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු. මිලියන 21.4 ක ආදායමක් රැස්කර තිබුණි.

## 2.3 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 11501 | 3.0 | 2.6 | 1.8 | 2.5 | 12.5 | 9.6 |

### 2.4 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශයෙහි 2014 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0336/0014/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.896,450 ක් විය.

### 2.5 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 115 - ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශය

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647(ඉ) | පවත්වා නොතිබුණි. |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| නිල වාහන සම්බන්ධයෙන් වූ ලොග් පොත් | මුදල් රෙගුලාසි 1645(අ) | යාවත්කාලීන කර නොතිබුණි. |

**3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී සිදුකර තිබූ එකතුව රු.1,275,124ක් වූ ගනුදෙනු 3 කට අදාල බිල්පත්/කුවිතාන්සි/අලුත්කිරීමේ නිවේදන ආදී වූ අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සංචිතයට අයත් වාහන 09 ක් සඳහා 2014 වර්ෂයේදී රු.2,015,711 ක් ඉන්ධන වියදම් වශයෙන් වැයකර තිබුණු නමුත් එම වියදම් සන්නිරීක්ෂණය කිරීමට අවශ්‍ය දෛනික ධාවන සටහන්, ගමන් පිළිබඳ මාසික සාරාංශ වාර්තා හා ඉන්ධන දහනය පරීක්ෂා කිරීමේ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) 2014 වර්ෂයේදී අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා පදනම් ආයතනය එක්ව ක්‍රියාත්මක කර තිබුණු ව්‍යාපෘති කළමනාකරණ වැඩමුළුවක් වෙනුවෙන් අමාත්‍යාංශයෙන් සහභාගි වූ නිලධාරින්ගේ අත්සන් ලේඛනයක් හෝ නිලධාරීන්ගේ සහභාගිත්වය තහවුරු කෙරෙන ප්‍රමාණවත් සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.3 විසර්ජන ගිණුම**

**----------------**

විසර්ජන ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් 03ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 ක සිට සියයට 63 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම**

මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව සළසා ඇති ප්‍රතිපාදනය ඉක්මවා බැරකම්වලට එළඹිය නොහැකි වුවත්, ශීර්ෂය යටතේ වැය විෂයයන් 9 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.745,092 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි

## 3.4 අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 04 දෙනෙකුට අවස්ථා 12 කදී එකතුව රු.154,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 09 කට අදාළව ලබා දී තිබුණු එකතුව රු.119,700 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී දින 22 ක සිට දින 56 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

## 3.5 ආදායම් ගිණුම්

අමාත්‍යාංශයේ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් 20.03.02.21 දරන ආදායම් සංකේතය යටතේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරී තිබුණි. එම ආදායම් සංකේතයට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2014 අප්‍රේල් 29 දිනැති අංක 01/2002(xviii) දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛය ප්‍රකාරව ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට අදාල ආදායම ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා වාර්තා කිරීම පිළිබඳ වගකීම ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් වෙත පවරා තිබුණ ද, ඒ අනුව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි. කෙසේ වුවද 2014 වර්ෂයේදී රු.21,384,958 ක ආදායම් රැස්කර තිබුණි.

(ආ) ලිහිසි තෙල් (Lubricant) ආනයනය සම්බන්ධයෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ හයිරැක්ස් තෙල් සමාගම (M/S Hyrax Oil SDN, BHS, Malaysia) අතර එළඹ තිබූ

ගිවිසුම (2008-2013) 2013 ඔක්තෝබර් 17 දින අවසන් වී තිබුණද, විගණනය සිදුකළ 2015 මැයි 22 දිනය වන විටත් නව ගිවිසුමකට එළඹීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කටයුතු කර නොතිබුණි.

## 3.6 වත්කම් කළමනාකරණය

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

ප්‍රයෝජනයට ගත නොහැකි එකතුව රු.58,161 ක් වටිනා භාණ්ඩ විකිණිය යුතු බවටත්, එකතුව රු.23,610 ක් වටිනා භාණ්ඩ විනාශ කළ යුතු බවටත් 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශ කර තිබුණි. 2012 හා 2013 වර්ෂවලට අයත් ප්‍රයෝජනයට ගත නොහැකි බව සඳහන් කර තිබුණු පිළිවෙලින් රු.76,115ක් හා රු.122,156 ක් වටිනා භාණ්ඩ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දින වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් ආයතන සතුව තිබුණු ඇතැම් වත්කම් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යාංශය විසින් භාවිතයට ගෙන තිබුණු අවස්ථා නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වාහන 5 ක් අමාත්‍යාංශය වෙත නිදහස් කර තිබුණි. එම වාහන 5 සඳහා අමාත්‍යාංශය විසින් වාහන නඩත්තු වියදම් වශයෙන් රු.2,364,603 ක් හා සංස්ථාව විසින් ඉන්ධන වියදම් ලෙස රු.806,563 ක් සමාලෝචිත වර්ෂයේදී වැය කර තිබුණි.

(ii) ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වාහන අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකු විසින් සමාලෝචිත වර්ෂයේදී වරින් වර භාවිතා කර තිබුණි.

## 3.7 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
| --- | --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 1646 | | සංචිතයට අයත් වාහන 09 ක 2014 ජනවාරි 01 දින සිට 2015 ජූනි 30 දින දක්වා වූ මාස 18 ක කාලපරිච්ඡේදයට අදාල දෛනික ධාවන සටහන් හා ගමන් පිළිබඳ මාසික සාරාංශයේ මුල් පිටපත විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක සී/ඒ1/17/1 දරන චක්‍රලේඛයේ | | |
| (i) 3:1 ඡේදය | | අමාත්‍යවරයාගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් ලබාදෙන වාහන සංඛ්‍යාව 03 ක් වුවද, අමාත්‍යවරයා විසින් රජයේ වාහන 05 ක් භාවිතා කර තිබුණි. |
| (ii) 3:3 ඡේදය | | මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතියකින් |

තොරව අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරයාගේ පරිහරණය සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් වාහන 7 ක් භාවිතා කර තිබුණි.

(iii) 3:4ඡේදය

නිල වාහන හෝ ප්‍රවාහන දීමනාව ලබා ගන්නා අමාත්‍ය කාර්යාලයට අයත් නිලධාරීන් සංචිතයට අයත් වාහනයක් ද වෙන්කර තබාගෙන භාවිතයට ගෙන තිබුණි.

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

---------------------------

1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන චක්‍රලේඛයේ 2:11 ඡේදය

අමාත්‍යාංශයට අයත් වාහන 14 කට අදාලව පසුගිය වර්ෂ තුනකට අධික කාලයක සිට මාස 6 කට වරක් සිදු කළ යුතු ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි.

**(ඈ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ**

---------------------------------

2013 අප්‍රේල් 16 දිනැති අංක HRD/CHI/S/194 දරන විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ ලිපිය

සිංගප්පූරුවේ පවත්වන ලද වැඩමුළුවක් සඳහා අමාත්‍යාංශයෙන් සහභාගී වී තිබුණු නිලධාරිනියක් විසින් ලබාගත් පුහුණුව පිළිබඳ වාර්තාවක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවට හා අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ඉ) ජාතික අයවැය චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2010 අප්‍රේල් 29 දිනැති අංක 146 දරන චක්‍රලේඛයේ 01 ඡේදය | | අමාත්‍යවරයාගේ කාර්යාලය, නියෝජ්‍ය අමාත්‍යවරයාගේ කාර්යාලය සහ අමාත්‍යාංශ ලේකම්ගේ කාර්යාලය එකම ස්ථානයක පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. |

**(ඊ) විශ්‍රාම වැටුප් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2014 ජනවාරි 10 දිනැති අංක 2014/01 දරන චක්‍රලේඛය | 59,072 | අමාත්‍යවරයාගේ කාර්යාලයෙහි කළමණාකරණ සහකාරවරයෙකු ලෙස සේවයේ නියුතුව සිටි විශ්‍රාමික රජයේ නිලධාරියෙකුට අදාල වැටුපට අමතරව විශ්‍රාම වැටුපට අයත් ජීවන වියදම් දීමනාව ද ගෙවා තිබීම. |

## 3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) වසර 43 ක් පැරණි සපුගස්කන්ද තෙල් පිරිපහදුව ඉතා අඩු ඵලදාවෙක් මත ක්‍රියාත්මක වූ බැවින්, එය වර්තමානයේ පවත්නා ඕනෑම බොරතෙල් වර්ගයක් පිරිසිදු කිරීමට හැකි ඉහළ තාක්ෂණික මෙවලම් සහිතව උසස් තත්ත්වයට නවීකරණය කළ යුතුව තිබුණි. මේ සඳහා නියමිත නවීකරණය හා පුළුල් කිරීමේ ව්‍යාපෘතිය 2015 ජුලි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. මේ අනුව, බලශක්ති සුරක්ෂිතතාව තහවුරු කිරීම, විදේශ විනිමය රටට ඉතිරි කරදීම, ආනයනික පිරිපහදු තෙල්වල ගුණාත්මකභාවය පිළිබඳ පවත්නා ගැටළු අවම කර ගැනීම, නිමි තෙල් (Finished Products) ආනයනය කිරීමට වැයවන අධික පිරිවැය අවම කිරීම, ආනයනික බොර තෙල් දේශීයව පිරිපහදු කිරීම තුළින් ලැබෙන තෙල් නිෂ්පාදනයේ ආර්ථික වාසිය ලබා ගැනීම, මිල අඩු මට්ටමක පවතින

බොර තෙල් (Heavy Crude Oil) භාවිතා කිරීමට ලැබෙන හැකියාව හා මෙහෙයුම් ලාභදායිත්වය වර්ධනය කර ගැනීමට හැකිවීම යන වාසිදායක තත්ත්වයන් ශ්‍රී ලංකාවට ළඟා කර ගැනීමට ඇති හැකියාව මගහැරී තිබුණි.

(ආ) දැනට පවතින වසර 43ක් සහ වසර 70 ක් පැරණි ඛනිජ තෙල් ගොඩබෑමේ නල මාර්ග පද්ධතිය, එහි සඵල ආයු කාලය වූ වසර 25 ක් ඉක්මවා දීර්ඝ කාලයක් තිස්සේ අකාර්යක්ෂම ලෙස මෙරට නිමි ඛනිජ තෙල් අවශ්‍යතාවයෙන් 2/3ක් සපුරා ගනිමින් පැවැතිණ. එසේ පරිහානියට පත් නල මාර්ගය හරහා ගොඩබෑම් කිරීම අනතුරුදායක බැවින් රට හරහා දිවෙන නල මාර්ග ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති කඩිනමින් ක්‍රියාවට නැංවීමට අපේක්ෂාකර තිබුණද, 2015 ජූලි 31 දින වන විටත් මෙම ව්‍යාපෘතිය ආරම්භ කර නොතිබුණි. මේ නිසා, ඛනිජ තෙල් ප්‍රවාහනය කාර්යක්ෂමව සිදුකිරීම, පාරිභෝගිකයාට ලැබෙන ඛනිජ තෙල්වල ඉහළ ගුණාත්මකභාවය, අනාගතයේ වැඩිවන ඉල්ලුම සපුරාලීම, ඛනිජ තෙල් තොග අපතයන්ගෙන් වන පාඩු හා මූල්‍ය පාඩු අවමවීම, අබලන් නල මාර්ග නඩත්තු කිරීමේ පිරිවැය අවම වීම යන වාසිදායක ප්‍රතිලාභ රටට අහිමි වී තිබුණි.

(ඇ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලේ භූගත තෙල් නල පද්ධතිය රු. මිලියන 1,000 ක වියදමින් ඉදිකිරීම සඳහා රු. මිලියන 5 ක් වැයකර තාක්ෂණික අධ්‍යයනයක් 2010 වර්ෂයේදී සිදුකර තිබුණි. එහි නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට 2015 නොවැම්බර් 30 දින වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

**3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

-----------------------------------

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම පිළිබඳව කිසිදු තහවුරු කර ගැනීමකින් තොරව අතිකාල, නිවාඩු දින වැටුප් හා ගමන් වියදම් වශයෙන් එකතුව රු.3,872,652 ක් ගෙවා තිබුණි. එම නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම තහවුරු කර ගැනීමට අවශ්‍ය සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂය සඳහා අමාත්‍යාංශ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැය විෂයය සඳහා රු.360,000 ක ප්‍රතිපාදන සළසා තිබුණි. එම ප්‍රතිපාදන උපයෝගී කරගෙන ලංකා ඛනිජ

තෙල් නීතිගත සංස්ථාවේ හා ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ නිලධාරීන් 20 දෙනෙකුගේ පුහුණු කටයුතු වෙනුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. අමාත්‍යාංශය විසින් වැය කළ මුදල් ආපසු අදාළ ආයතනවලින් අයකර ගැනීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 3.10 අවිධිමත් ගනුදෙනු

----------------------

අමාත්‍ය කාර්යාලයේ මහජන සම්බන්ධතා නිලධාරියෙකු හට ඩීසල් වාහනයක් අනුයුක්ත කර මාසිකව රු.25,724 ක ඩීසල් සඳහා ඉන්ධන දීමනාව ගෙවිය යුතුව තිබුණි. නමුත් අමාත්‍යාංශය විසින් මාස 9 ක කාල පරිච්ඡේදයක් සඳහා ඩීසල් සඳහා ඉන්ධන දීමනාව වෙනුවට පෙට්‍රල් සඳහා ඉන්ධන දීමනාව ලෙස රු.35,316 ක් මාසිකව ගෙවා තිබුණි. එසේ වැඩිපුර ගෙවා තිබුණු දිමනාවෙන් රු.21,176 ක් 2015 ඔක්තෝබර් 30 දින වන විටත් ආපසු අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3.11 පාඩු හා හානි

----------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ ව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා පදනම් ආයතනය මගින් සංවිධානය කරන ලද තායිලන්තයේ බැංකොක් නුවරදී පවත්වන ලද පුහුණු පාඨමාලාවකට සහභාගීවීම සඳහා අමාත්‍යාංශයේ වැඩබලන අතිරේක ලේකම්වරයකු වෙනුවෙන් රු.99,000 ක් එම ආයතනයට ගෙවා තිබුණි. මෙම නිලධාරියා අදාල පුහුණු පාඨමාලාව සඳහා සහභාගි වී නොතිබුණු අතර එසේ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීමට අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේදී හදිසි අනතුරු හේතුවෙන් අමාත්‍යාංශයේ වාහන 2කට අලාභහානි සිදුවී තිබුණි. එම හානිවීම් අළුත්වැඩියා කිරීම සඳහා රු.7,307,949 ක් අමාත්‍යාංශය වැයකර තිබුණි. ඒ සඳහා රක්ෂණ වන්දි වශයෙන් රු.6,529,472ක් පමණක් ලැබී තිබුණි. මෙම අලාභහානිය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 109 ප්‍රකාරව අමාත්‍යාංශය විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ අමාත්‍ය කාර්යාලයේ හා නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය සිය රාජකාරි වලින් ඉවත්වී තිබුණද, අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ලබාදී තිබුණු රු.333,900 ක් වටිනා භාණ්ඩ වර්ග 5 ක් හා වටිනාකම ඉදිරිපත් නොකළ වර්ග 10 කට අයත් භාණ්ඩ 28 ක් නැවත අමාත්‍යාංශයට භාරදී නොතිබුණි.

**3.12 අනාර්ථික ගනුදෙනු**

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට යාබදව පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක් නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය වෙනුවෙන් කුලියට ලබාගෙන ඒ වෙනුවෙන් 2014 වරෂයේදී අමාත්‍යාංශය විසින් රු.5,484,254 ක් වැය කර තිබුණි. නියෝජ්‍ය අමාත්‍යවරයා හෝ ඔහුගේ කාර්ය මණ්ඩලය එම ගොඩනැගිල්ලේ කාර්යාලයක් පවත්වා නොතිබුණි. එහෙත්, නියෝජ්‍ය ඇමති කාර්යාලය ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ගොඩනැගිල්ලෙහි කොටසක පවත්වා තිබුණු අතර ඒ වෙනුවෙන් 2014 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් සංස්ථාවට රු.10,011,545 ක් ගෙවා තිබුණි. ඒ අනුව, කුලියට ලබාගෙන තිබුණු පෞද්ගලික ගොඩනැගිල්ල සඳහා වැය කරන ලද රු.5,484,254 ක වියදම ආර්ථික නොවන වියදමක් වී තිබුණි.

(ආ) 2014 සැප්තැම්බර් මාසයේදී රු.6,694,263 ක් ගෙවා හිටපු නියෝජ්‍ය ඇමතිවරයා වෙනුවෙන් ආනයනය කරන ලද මෝටර් රථයක් නියමිත කාලය තුළ රු.1,714,272 ක් වූ දේශීය නියෝජිත ගාස්තු ගෙවා නිදහස් කර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් ප්‍රමාද ගාස්තු වශයෙන් තවත් රු.230,581 ක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවා තිබුණි.

(ඇ) 2014 මාර්තු 31 දින වන විට අමාත්‍යාංශ ගොඩනැගිලි පරිශ්‍රය තුළ wi-fi අන්තර්ජාල පහසුකම් ස්ථාපිත කිරීම වෙනුවෙන් රාජ්‍ය සමාගමක් වෙත රු.1,458,823 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. අමාත්‍යාංශය විසින් ඊට පෙර ලබා ගෙන තිබුණු රැහැන් සහිත අන්තර් ජාල පහසුකම් වූ ඩයලොග් 4G wi-fi සම්බන්ධතාවය අත්හිටුවීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් මාස 14 ක කාලසීමාවක් වෙනුවෙන් එම පෞද්ගලික ආයතනය වෙත රු.61,278 ක් ගෙවීමට සිදුවී තිබුණි.

**3.13 කළමනාකරණ දුර්වලතා**
-----------------------------
නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේදී ශ්‍රී ලංකා පදනම් ආයතනය සමඟ එකතු වී අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබූ කාර්ය මණ්ඩල පුහුණු කිරීමේ වැඩමුළුවක් සඳහා අමාත්‍යාංශයෙන් සහභාගිවීමට නියමිත නිලධාරීන්ගේ නාම ලේඛනය අනුව නිලධාරීන් තිදෙනෙකු පමණක් වැඩමුළුව සඳහා සහභාගී කර තිබුණද, නිලධාරීන් 36 දෙනෙකු වෙනුවෙන් ගෙවීම් කර තිබීම හේතුවෙන් එක් නිලධාරියෙකු හට රු.18,000 ක් බැගින් නිලධාරීන් තිදෙනෙකු වෙනුවෙන් රු.54,000ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ආ) 2014 වර්ෂයේ අමාත්‍යාංශ කාර්ය මණ්ඩල පුහුණු කිරීම යටතේ වෙන්කර තිබූ රු.1,800,000 ක මුදලින් සියයට 30.56 ක් හෙවත් රු.550,000 ක් "International Program on Project Management" නැමැති වැඩසටහනට සහභාගි වී තිබුණු අතිරේක ලේකම් (පාලන) වෙනුවෙන් වැය කර තිබුණි. තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් හෙවත් රු.360,000 ක් බාහිර ආයතනවල නිලධාරීන් පුහුණු කිරීම් වෙනුවෙන්ද, සියයට 5.55 ක් හෙවත් රු.99,900 ක් කිසිදු නිලධාරියෙකු සහභාගි නොවූ වැඩසටහනක් වෙනුවෙන්ද විසින් වැය කර තිබුණි. ඒ අනුව, අමාත්‍යාංශයෙහි අනෙකුත් කාර්ය මණ්ඩල පුහුණු කිරීම සඳහා රු.764,450 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 42.47 ක් පමණක් වැය කර තිබුණි.

(ඇ) වාහන අළුත්වැඩියා, වාහන අනතුරු ආදිය පිළිබඳ විස්තර මෙන්ම ටයර් හා ටියුබ් යෙදීම් සහ වාහන සේවා කිරීම පිළිබඳ විස්තර හා දිනයන් ද ඇතුළත් කර වාහන ලොග් පොත් යාවත්කාලීන කර පවත්වා නොතිබීම හා අමාත්‍යාංශය සතු වාහන පිළිබඳ විස්තර ඇතුළත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

(ඈ) වාහන අළුත්වැඩියාවෙන් ඉවත් කරන ලද කොටස් නැවත ගබඩාව වෙත භාර දීම හෝ ඒ පිළිබඳව ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා පවත්වා නොතිබුණි.

(ඉ) අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී වාහන 22 ක් අළුත්වැඩියා කිරීම සඳහා රු.5,404,849 ක් වැය කර තිබුණි. මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී වාහන අළුත්වැඩියා සඳහා යොමු කිරීමේදී ඒ පිළිබඳ විශේෂ දැනුමක් ඇති

ස්වාධීන අයකුගෙන් හෝ ආයතනයකින් වාහනය පරීක්‍ෂාකරවා ගෙන ඇස්තමේන්තුවක් ලබාගැනීම හා අළුත්වැඩියාවෙන් පසු එය නිසි පරිදි ඉටුකර තිබෙන බවට සහතික කරවා ගැනීමක් සිදු කර තිබුණු බවට සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 3.14 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 13 | 2 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 01 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 50 | 40 | 10 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 26 | 21 | 05 |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 03 | 02 | 01 |
| | **එකතුව** | **96** | **77** | **19** |

### (ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශයේ වැඩසටහන් අංක 02 - අමාත්‍යාංශ පරිපාලනය සහ ආයතන සේවා යටතේ බඳවා ගෙන තිබූ මෙහෙයුම් කාර්ය මණ්ඩලයෙහි නිලධාරීන් දෙදෙනෙකු වැඩසටහන් අංක 01 යටතේ වූ අමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය අංශයේ සේවය සඳහා අවිධිමත් ලෙස මුදාහැර තිබුණු අතර, ඔවුන් වෙනුවෙන් අමාත්‍යාංශයේ වැඩසටහන් අංක 02 යටතේ වූ ප්‍රතිපාදනවලින් රු.472,150 ක් වැය කර තිබුණි.